ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
லலித் அத்துலத்முதலி மஹபொல உயர்க்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
LALITH ATHULATHMUDALI MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

4 වන මහල, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, 191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා.
4வது மாடி ,ஜே.ஆர்.ஜயவர்தன நிலையம்,191,தர்மபால மாவத்தை,கொழும்பு 07.
4TH Floor, J.R. Jayewardene Centre, 191, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. MTF/1/1/II(2021/2022) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025.05. 29 |

මහත්මයාණනි/මෙනවියනි,

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2021/2022.**

01. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය විසින් ඔබගේ අධ්‍යාපන ආයතනයේ නිර්දේශය පරිදි සාමාන්‍ය ශිෂ්‍යත්වයක් පිරිනැමීමට ඔබ තෝරාගෙන ඇති බව සතුටින් දන්වමි.

02.

(i) ඔබට මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කෙරෙනුයේ ඔබගේ උසස් අධ්‍යාපන කටයුතු ආර්ථික අසීරුතාවයකින් තොරව අඛණ්ඩව හා අනලස්ව කර ගෙන යාමට සඵල පිටුබලයක් සැපයීමේ උතුම් පරමාර්ථයෙනි. ඒ අනුව ඔබ තෝරාගෙන ඇති පාඨමාලාව සඳහා නියමිත අධ්‍යයන කාලසීමාව තුල පාඨමාලාව පැවැත්වෙන කාලයේදී මසකට රු.2,500/- බැගින් එක් අධ්‍යයන වර්ෂයකට වාරික 09 ක උපරිමයකට යටත්ව ආයතනයේ නිර්දේශය පරිදි එම ආයතනය මඟින් මෙම ශිෂ්‍යත්ව මුදල් ගෙවීම කරනු ලැබේ.(2025 අප්‍රේල් මස සිට වාරික මුදල රු.3,750/-ක් වේ.) (ඔබගේ බැංකු ගිණුම් පිළිබඳ විස්තර ලබා ගැනීමට ඇමුණුම් අංක 02 සම්පූර්ණ කලයුතුවේ.)

(ii) රැකියාවක නිරතවීම නිසා හෝ වෙනත් ඕනෑම හේතුවක් නිසා ඕනෑම අවස්ථාවක මෙම ශිෂ්‍යත්වය නතර කිරීමට ඉල්ලා සිටිය හැකිය.

03. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල කොන්දේසි මාලාව මෙයට යා කර ඇත. එම කොන්දේසි සුපරීක්ෂාකාරීව කියවනු මැනවි. ඔබ ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව එම කොන්දේසිවලට යටත්වනු ඇත.

04. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂ සහ අධ්‍යාපන ආයතනයේ බලධාරීන් විසින් මෙම ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් මතුවට පනවනු ලබන කොන්දේසි හා රෙගුලාසිවලට ද ඔබ යටත්වනු ඇත.

05. පාඨමාලාව හා ලියාපදිංචි අංකය ආදියෙහි මතු සිදුවන වෙනස්කම් අප්‍රමාදව ආයතනය වෙත දැන්විය යුතුය. ඔබගේ ශිෂ්‍යත්ව ප්‍රදාන අංකය ඉදිරි ලිපි ගනුදෙනුවලදී සඳහන් කලයුතුය. අධ්‍යයන කටයුතු ආරම්භ කල පසුව සියලුම ලිපි ගනුදෙනු ඔබගේ ආයතනයේ ප්‍රධානියා මඟින් සිදුවිය යුතුය.

06. මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයේ සම්ප්‍රදාය අනුව, එයට හිමිකම් ලැබීම සඳහා ඔබ **විසින් පෞද්ගලිකව ශිෂ්‍යත්වය භාරගත යුතුය. එසේ නොවුවහොත් ශිෂ්‍යත්වය අවලංගු වනවා ඇත.**

07. ඔබගේ අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

මෙයට විශ්වාසී

ලක්ෂ්මි දර්ශිකා,
ගණකාධිකාරි (වැඩබලන)
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සභාපති වෙනුවට

## <u>මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානයට හා වාරික ගෙවීම්වලට අදාල කොන්දේසි</u>

මහපොළ ශිෂ්‍යත්වයට හිමිකම් ලැබීමට හා එම ශිෂ්‍යත්වය වෙනුවෙන් ගෙවන ශිෂ්‍යත්ව වාරික මුදල් පාඨමාලාවේ අධ්‍යයන කාලය තුලදී ලබාගැනීමට පහත සඳහන් අවශ්‍යතා හා කොන්දේසි සපුරාලිය යුතුවේ.

1. ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබ ඇති පාඨමාලාවේ, ශිෂ්‍යත්වලාභියා විසින් අධ්‍යයන කටයුතු වලින් ලබාගන්නා ප්‍රගතිය මත ඔබ ආයතනයේ නිර්දේශය අනුව, ශිෂ්‍යත්ව වාරික මුදල් මාසිකව ගෙවනු ලැබේ.

    1.1. ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ සිසුන් සඳහා අධ්‍යයන වර්ෂයකට වාරික 09 ක උපරිමයකට යටත්ව පාඨමාලාවට නියමිත අධ්‍යයන වර්ෂ ගණන සඳහා පමණක් ශිෂ්‍යත්ව වාරික ගෙවනු ලැබේ.

    1.2 මෙම ශිෂ්‍යත්ව වාරික ලබාගැනීම සඳහා පූර්ණකාලීනව පාඨමාලාවේ නිරත විය යුතු අතර, පාඨමාලාවට පූර්ණකාලීනව සහභාගී නොවන අයට ශිෂ්‍යත්ව වාරික ගෙවනු නොලැබේ.

    1.3 පාඨමාලාවට නියමිත දේශන නිබන්ධන පන්ති හා ප්‍රායෝගික පන්ති ආදී පාඨමාලාවේ කටයුතුවලට විධිමත් පරිදි, සහභාගී විය යුතු අතර, පැමිණීම 80% සම්පූර්ණ විය යුතුය. එසේ නොවන අවස්ථාවල ඒ පිළිබඳ ආයතනයෙන් ඉදිරිපත් කරන නිර්දේශය අනුව ශිෂ්‍යත්ව ගෙවීම් අත්හිටුවීම සිදුවනු ඇත.

    1.4 පාඨමාලාව පැවැත්වෙන කාලය තුලදී මසකට එක් ශිෂ්‍යත්ව වාරිකය බැගින් පමණක් අධ්‍යාපන ආයතනය මඟින් ශිෂ්‍යත්වලාභියා වෙත ගෙවනු ලැබේ.

    1.5 ශිෂ්‍යත්ව වාරික නිසි පරිදි ලබාගත යුතුය. ලබා නොගත් වාරික අනවශ්‍ය හා අත්හැර දැමූ ශිෂ්‍යත්ව වාරික ලෙස සලකනු ලැබේ. එවැනි වාරික ආයතනයේ නිසි නිර්දේශයකින් තොරව නැවත නොගෙවනු ඇත.

    1.6 ශිෂ්‍යත්ව වාරික ගෙවීම සඳහා ශිෂ්‍යත්වලාභීන්ගේ නම් ආයතනය මඟින් නිර්දේශ කරන අතර එසේ නිර්දේශ නොවුවහොත් ඒ පිළිබඳව ආයතනයෙන් විමසිය යුතුය.

    1.7 මෙම ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව මෙම පාඨමාලාව හෝ වෙනත් පාඨමාලාවකට හෝ වෙනත් කිසිදු ශිෂ්‍යත්වයක් හෝ ශිෂ්‍යාධාර මුදලක් ලබාගැනීමට අවසර නැත. වෙනත් ශිෂ්‍යත්වයකට හිමිකම් ලබන්නේ නම් තම මනාපය පරිදි පළමු ශිෂ්‍යත්වයේම පමණක් රැඳී සිටීම හෝ පළමු ශිෂ්‍යත්වය අවලංගු කර නව ශිෂ්‍යත්වය ලබා ගැනීම හෝ සිදුකළ හැකිය. **එවැනි අවස්ථාවලදි ශිෂ්‍යයා විසින් වහාම මෙම කාර්යාලය වෙත දැනුම් දිය යුතුය.**

2. පහත සඳහන් අවස්ථාවල **ශිෂ්‍යත්වය අවලංගු** වනු ඇත. ඒ සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ.

    i. පාඨමාලාවට සහභාගී නොවීම.
    ii. දීර්ඝකාලීනව පාඨමාලාවට සහභාගී නොවීම.
    iii. වාර්ෂික විභාග අසමත් වීම.
    iv. පාඨමාලාව අත්හැරයාම.
    v. විනය විරෝධි ක්‍රියා හේතුන් මත පන්ති තහනම් කිරීම.
    vi. නවක වදය සම්බන්ධයෙන් දඬුවම් ලැබීම.
    vii. විෂමාචාර ක්‍රියා පිළිබඳ වැරදිවලදී හෝ අපචාර හා අපයෝජන සිද්ධීන්ට සම්බන්ධවීම මත ආයතනය මඟින් විනය පරීක්‍ෂණ පවත්වා දඬුවම් ලබා ඇති අවස්ථාවකදී හෝ අනෙකුත් වැරදි සම්බන්ධව උසාවියක් මඟින් දඬුවම් ලබා ඇති අවස්ථාවක
    viii. ආයතනවල දේපලවලට හා රාජ්‍ය දේපලවලට හානි සිදුකිරීම මත දඬුවම් ලැබීම.
    ix. ආදායම් ලැබීම පිණිස ව්‍යාපාරයක, සේවයක හෝ රැකියාවක නියුක්තවීම යන හේතුද මෙම ශිෂ්‍යත්ව වාරික මුදල් සහ හිමිකම් නොලැබීමට හේතුවනු ඇත.

3. ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව වාරික සම්බන්ධයෙන් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ තීරණය අවසන් තීරණය වනු ඇත.

අධ්‍යක්‍ෂ
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල